NEW

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

| 33 | S | II |
|---|---|---|

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය-2019.
கல்விப் பொதுத் தராதரப் பத்திர(சாதாரண தர)ப் பரீட்சை
General Certificate of Education (Ord. Level) Examination.

ඉතිහාසය II
வரலாறு II
History II

පෙරහුරු පරීක්ෂණය
மாதிரி வினாத்தாள்
Modal Paper

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three hours.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடம்.
Additional Reading Time - 10 minutes.

අමතර කියවීම් ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සැලකිය යුතුයි:
- I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

1. (අ) පහත (i) යටතේ ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) අඹන් ගඟ, හුරුළු වැව, පල්ලවංක, ගිම්හතිත්ථ, උඩමල්ල, මිනිපේ ඇළ, අලිගල, පොළොන්නරුව, නාගදීපය, ගල්ඔය, හෝපිටිගමුව, කම්මල්තොට. (ලකුණු 12 යි)

(ii) ගෝව, රතු මුහුද, සින්දු ගඟ, නාගසාකි, ජිනෝවා, පෙරුසලම. (ලකුණු 06 යි)

(ආ) (i) පහත A,B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - බෙලිගල දළදා මැඳුරක් කරවා දන්ත ධාතූන් වහන්සේ තැන්පත් කර වූ රජතුමා.
*B* - රජතුමා හා ප්‍රධාන නිළධාරීන්ගෙන් සැදුම්ලත් රාජසභාව.
*C* - වැඩවසම් සමයේ දී රජුට අයත් ඉඩම් වල වගා කිරීම වෙනුවෙන් අය කළ බද්ද.
*D* - නාච්චදූව වැව සම්බන්ධ ගංගාව. (ලකුණු 04 යි)

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(ii) 1. 'A' අක්ෂරයෙන් දක්වෙන නිර්මාණය කුමක් ද?
2. එය හමුවී ඇති ප්‍රදේශය කුමක් ද?
3. එම නිර්මාණය අයත් වන කාලවකවානුව කුමක් ද?
4. මෙය භාවිතා කර ඇත්තේ කවුරුන් සඳහා ද ? (ලකුණු 04 යි)


A

(iii) 1. 'B' රූපයෙන් දැක්වෙන රජතුමා කවුද?
2. වර්තමානයේ මෙය දක්නට ලැබෙන ස්ථානය කුමක් ද ?
3. මෙතුමා විසින් පූජාවක් කරන ලද්දේ කුමන ස්ථානයකට ද?
4. මෙකළ විදේශ සම්බන්ධතා පැවැත්වූ රට කුමක්ද?
(ලකුණු 04 යි)


B

## II කොටස

**2. (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ තිබූ බවට හමු වී ඇති මෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන තුනක් නම් කරන්න.** **(ලකුණු 03 යි)**

**(ii) ප්‍රාග් ඓතිහාසික යුගයේ ජීවත් වූ කාන්තාවන්ගේ ශරීර ස්වභාවයේ දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.** **(ලකුණු 04 යි)**

**(iii) *A* - දේශපාලන බලය මධ්‍යගත වීමෙදී 'ආලකමන්දාව' ලෙස හැඳින්වූයේ කුමක් ද?** **(ලකුණු 01 යි)**
***B* - පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබුණු ආකාර දෙකක් නිදසුන් දෙමින් දක්වන්න.** **(ලකුණු 04 යි)**

**(iv) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ හා පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයාගේ පහත සඳහන් අංශ වල දක්නට ලැබුණු වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න.**
*A* වාසස්ථාන.
*B* ආහාර රටාව. **(ලකුණු 06යි)**

**3. (i) මෙරට ක්‍රියාත්මක වූ දකුණු ඉන්දීයානු සම්භවයක් ඇති වෙළඳ සංවිධාන තුනක් සඳහන් කරන්න.** **(ලකුණු 03යි)**

**(ii) ගොඩනැගිලි සැදීම සහ උද්‍යාන අලංකරණය සම්බන්ධයෙන් ඉතා ඉහළ දැනුමක් අපේ පැරණි සමාජය තුළ පැවැති බවට නිදසුන් දෙකක් සඳහන් කරන්න.** **(ලකුණු 04යි)**

**(iii) *A* - පහත සඳහන් කරුණු ඇතුළත් වන සෙල්ලිපි මොනවාදැ'යි ලියන්න.**
1. රට අභ්‍යන්තරයේ වෙළඳාම මැනවින් පවත්වාගෙන යාම පිළිබඳව,
2. වැව් වලින් ගොවිතැන් කරන කුඹුරු වල සිහිනැටි වී මිස මුං ඇට වැපිරීම නොකළ යුතු බව,

**B** - ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී මූලාශ්‍රයක් ලෙස සෙල්ලිපිවල වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න **(ලකුණු 05යි)**

**(iv)** 'ඉතාමත් ඈත කාලයක සිට ලංකාවේ ජන වර්ග අතර සහජීවනය ඉතා ඉහළ මට්ටමක පැවතින' මේ බව සනාථ කිරීම සඳහා කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න **(ලකුණු 06යි)**

**4.(i) පුරාණ කාලයේ බෞද්ධ විහාරාරාමවල විසූ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉඳි කරන ලද පොකුණු තුනක් නම් කරන්න.** **(ලකුණු 03යි)**

**(ii) පහත *A,B,C* හා *D* වලින් දැක්වෙන පැරණි තාක්ෂණය හා සම්බන්ධ නිර්මාණ** මොනවාදැයි **අනුපිළිවෙළින් දක්වන්න.**
**A - ස්වාභාවික ව ජනනය වන පීඩනය නිසා ඉහළට එසවෙන ජල කඳේ උස වෙනස් කිරීම.**
**B - අකුණු සැර වැදීමේ අනතුරුවලින් ගොඩනැගිලි ආරක්ෂා කර ගැනීමේ විද්‍යාත්මක ආදේශය.**
**C - සංකීර්ණ ශල්‍යකර්ම සඳහා මෙවලම් භාවිතය.**
**D - පොළොවට ලම්බාකාරවීමෙන් වස්තුව මඟින් පොළොව මත ඇති කරන පීඩනය අවම කර ගොඩනැගිලි ඉඳිකිරීම.** **(ලකුණු 04යි)**

**(iii) වැව් බැම්ම ඉඳිකිරීමේ දි සැලිකිලිමත් වූ කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.** **(ලකුණු 05යි)**

**(iv) පැරණි ශ්‍රී ලංකාවේ මැටි බඳුන් තැනීම හා ආභරණ තැනීම සඳහා දියුණු තාක්ෂණයක් භාවිතා කළ ආකාරය නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.** **(ලකුණු 06යි)**

**5.(i)** ඉංග්‍රීසි ජාතිකයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට හේතු වූ කරුණු **තුනක්** සඳහන් කරන්න **(ලකුණු 03යි)**

**(ii)** ඉංග්‍රිසින්ගේ දූත ගමන් අතර පහත දැක්වෙන පුද්ගලයන් වැදගත් වේ මොවුන්ගේ ගමනේ අරමුණ හා ප්‍රතිඵල වෙන වෙනම සඳහන් කරන්න
1782 දි හියු බොයිඩ් -
1795 දි රොබර්ට් ඇන්ඩෲස් - **(ලකුණු 04යි)**

**(iii)** ක්‍රි.ව. 1818 නිදහස් සටනේ ප්‍රතිඵල **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න **(ලකුණු 05යි)**

**(iv)** ක්‍රි.ව. 1848 නිදහස් සටනට කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ බලපෑම් ඇති කළේය මේ පිළිබඳ ඔබේ අදහස් කරුණු **තුනක්** ඇසුරින් විස්තර කරන්න **(ලකුණු 06යි)**

**6.(i)** පහත සඳහන් ප්‍රකාශන මුද්‍රණය කළ සංවිධාන සඳහන් කරන්න
1832 මාසික තෑග්ග -
1840 ලංකා නිධානය -
1842 උරගල - **(ලකුණු 03යි)**

**(ii)** ශ්‍රී ලංකාවේ 1912 ක්‍රියාත්මක වූ අමද්‍යප ව්‍යාපාරයේ කැපීපෙනෙන ලක්ෂණ හතරක් ලියන්න **(ලකුණු 04යි)**

**(iii)** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න **(ලකුණු 05යි)**

**(iv) A** 1935 වසරේදී සමසමාජ පක්ෂය පිහිටුවා ගත් නායකයින් දෙදෙනෙකු නම් කරන්න
**B** ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ නිදහස සඳහා උද්ඝෝෂණ වලදී 'සූරියමල් ව්‍යාපාරය' ක්‍රියාත්මක වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න **(ලකුණු 06යි)**

**7.(i)** ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න **(ලකුණු 03යි)**

**(ii)** ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව සතු බලතල **හතරක්** ලියන්න **(ලකුණු 04යි)**

**(iii)** ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද විමසීම් ක්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න **(ලකුණු 05යි)**

**(iv)** ශ්‍රී ලංකාවේ නිදහසින් පසු සිදු වූ සංවර්ධන කටයුතු පිළිබඳ පහත කරුණු ඔස්සේ විස්තර කරන්න

- කෘෂිකර්මාන්ත සංවර්ධනය
- අධ්‍යාපනය
- සමාජ සුභසාධනය **(ලකුණු 06යි)**

## III කොටස

**8. (i) වෙළඳ හා වාණිජ කටයුතු වල දියුණුව නිසා ඉතාලියේ බිහි වූ නගර තුනක් නම් කරන්න. (ලකුණු 04යි)**

**(ii) පහත දැක්වෙන දෑ ලොවට දායාද කළ පුද්ගලයින්ගේ නම් *A,B,C* හා *D* අනුපිළිවෙළින් ලියන්න.**
***A*** **- ගුරුත්වාකර්ෂණ නියමය.**
***B*** **- දුර දක්නය.**
***C*** **- ග්‍රහලෝක සූර්යා වටා ඉලිප්සාකාරව ගමන් කරන බව.**
***D*** **- රුධිර සංසරණ පද්ධතිය පිළිබඳව තොරතුරු සෙවීම. (ලකුණු 04යි)**

**(iii) කාර්මික විප්ලවය හේතුකොටගෙන සාමාජීය ක්ෂේත්‍රය තුළ ඇති වූ යහපත් බලපෑම් එකක් විස්තර කරන්න. (ලකුණු 05යි)**

**(iv) කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන ලද බලපෑම කරුණු තුනක් ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05යි)**

**9.(i)** යුරෝපීයයන් ඇමරිකාවේ ජනපද පිහිටුවීමට බල පෑ හේතු **තුනක්** සඳහන් කරන්න **(ලකුණු 03යි)**

**(ii) A** 'රජය නම් මමයි' ප්‍රකාශය කළ රජතුමා කවුරුන්ද ?
**B** ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතු **තුනක්** සඳහන් කරන්න **(ලකුණු 04යි)**

**(iii)** පළමු ලෝක සංග්‍රාමයේ චූදිතයා වූ ජර්මනියට වර්සේල්ස් ගිවිසුමෙන් පැනවූ දඬුවම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න **(ලකුණු 05යි)**

**(iv)** දෙවන ලෝක සංග්‍රාමය නිසා ඇති වූ ප්‍රතිඵල **තුනක්** කෙටියෙන් විස්තර කරන්න **(ලකුණු 06යි)**

***